ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
இலங்கைச் சாரணர் சங்கம்
Sri Lanka Scout Association
Incorporated by Act No.13 of 1957
Reg.by Boy Scout International Bureau on -22.02.1953

2020.01.04

*චක්‍රලේඛ අංක : 01 /2020*

සියලුම මූලස්ථාන කොමසාරිස්වරුන්
දිසා කොමසාරිස්වරුන්
සහය දිසා කොමසාරිස් (බාලදක්ෂ බාලිකා/පෝතක බාලදක්ෂ/පුහුණු හා පරිපාලන)

## ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
## බාලදක්ෂ ව්‍යාපාරයේ බාලදක්ෂ බාලිකා කටයුතු පිළිබඳ ප්‍රතිපත්ති මාලාව

- පුහුණුවීම් කටයුතු වලදී, පාසලේ හෝ විවෘත සමූහයක බාලදක්ෂ බාලිකාවන් සිටී නම් පුහුණුව ලැබූ කාන්තා බාලදක්ෂ නායිකාවක් සිටීම අනිවාර්යය.

- බාහිර ක්‍රියාකාරකම් වලදී (ශ්‍රමදාන/ක්‍රියාකාරකම්/පාගමන්/කඳවුරු),බාලදක්ෂ බාලිකාවන් සහභාගී කරවීමේදී පූර්ණකාලීනව බාලදක්ෂ ආචාර්ය වරියක් සිටීම අනිවාර්යය.

- ප්‍රගති හා ප්‍රවීණතා පදක්කම් සඳහා පාගමන් යාමේදී අදාළ දිසාවේ සහය දිසා කොමසාරිස් (වැඩසටහන්) ගේ යොමු කිරීම පරිදි එම දිසාවේ බාලදක්ෂ බාලිකා අංශය භාර සහය දිසා කොමසාරිස්වරියගේ හා බාලදක්ෂ බාලිකාවන් භාර බාලදක්ෂ ආචාර්යවරියන්ගේ අධීක්ෂණය යටතේ යොමු කළ යුතුය.

- ඔවුන්ගේ රාත්‍රී නවාතැන්, යටිතල පහසුකම් හා ආරක්ෂාව පිළිබඳ සියලු අධීක්ෂණයන් සහය දිසා කොමසාරිස් (වැඩසටහන්) ගේ යොමු කිරීම පරිදි සහය දිසා කොමසාරිස් (බාලදක්ෂ බාලිකා) ගේ අධීක්ෂණය යටතේම සිදුවිය යුතුයි.

- කඳවුරු වලට සහභාගී වීමේදී හා පාගමන් වලදී අවශ්‍ය නම් සහය දිසා කොමසාරිස් (වැඩසටහන්), සහය දිසා කොමසාරිස් (බාලදක්ෂ බාලිකා) සහ බාලදක්ෂ ආචාර්යවරියගේ නිර්දේශය මත දිසා කොමසාරිස් ගේ අනුමැතිය යටතේ මවකගේ සහභාගීත්වය ලබා ගත හැක.

- සංවිධානාත්මක වැඩසටහන්වලට සහභාගීවීමේදී තම කණ්ඩායමේ බාලදක්ෂ බාලක හා බාලිකාවන් එක්ව කටයුතු කළ හැකි වුවද රාත්‍රී 6 න් පසු බාලදක්ෂ බාලිකාවන් තමන්ට වෙන් කර ඇති ස්ථානය තුල රැඳී සිටිය යුතුයි.

- විශේෂිත වැඩසටහන් සඳහා සවස 6 සිට 9 දක්වා කාලය තුළ සහභාගී කරවන්නේ නම් අනිවාර්යයෙන් සහය දිසා කොමසාරිස් (බාලදක්ෂ බාලිකා) හා බාලදක්ෂ ආචාර්යවරියගේ පූර්ණ කාලීන අධීක්ෂණය යටතේම සිදුවිය යුතුයි.

  (දිසා වල බාලදක්ෂ බාලිකාවන්ගේ කටයුතු කරගෙන යාමේදී දිසා කොමසාරිස් හා අනෙකුත් අංශ භාර සහය දිසා කොමසාරිස්වරුන් සමඟ සාමූහිකව වැඩකටයුතු කරගෙන යෑම අත්‍යාවශ්‍ය බව සලකන්න)

- බාලදක්ෂ බාලිකාවන් ඇතුලත් කර ගැනීමේ දී අදාළ පාසලේ බාලදක්ෂිකා කටයුතු ක්‍රියාත්මක නොවන්නේ නම් පමණක්, බාලිකාවන් බාලදක්ෂ කටයුතු සඳහා ඇතුලත් කර ගත හැකිය.

65, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත කොළඹ 02, ශ්‍රී ලංකා | Tel : +94 11 2 433 131/+94 11 5 231512

SCOUTS
Creating a Better World

ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
இலங்கைச் சாரணர் சங்கம்
Sri Lanka Scout Association

2011. 03-15

Gla

2011.03.15

චක්‍රලේඛ අංක 10/2011

මූලස්ථානයේ සියලුම කොමසාරිස් වරුන්
පළාත් කොමසාරිස් වරුන්
දිසා කොමසාරිස් වරුන්
සහය දිසා කොමසාරිස්(කාන්තා කටයුතු/පෝතක/පුහුණු හා පරිපාලන)

## ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
## බාලදක්ෂ ව්‍යාපාරයේ පෝතක හා බාලදක්ෂ අංශයේ බාලදක්ෂ (කාන්තා) කටයුතු පිළිබඳ සංශෝධිත නිති පද්ධතිය

1. පාසැල් හෝ විවෘත සමූහයක පෝතක බාලදක්ෂ රැළක් හෝ බාලදක්ෂ කණ්ඩායමක් පවත්වාගෙන යා හැක්කේ පෝතක හෝ බාලදක්ෂ පුහුණුව ලැබූ කාන්තා සාමාජිකාවන්ට පමණි. මිශ්‍ර විදුහල් වල හා කාන්තා විදුහල් වල කාන්තා බාලදක්ෂ කටයුතු කිරීමේදී **එම කාර්යන් වල සම්පූර්ණයෙන්ම නියැලිය හැක්කේ සුදුසුකම් ලැබූ කාන්තා නායිකාවන්ට පමණි. මිශ්‍ර විදුහල් වල හෝ පිරිමි විදුහල් වල කාන්තා නායිකාවන් හට පිරිමි ළමුන් සඳහා බාලදක්ෂ කටයුතු කිරීමට කිසිදු අවස්ථාවක අවසරයක් නොමැත.**(සුවිශේෂ හේතූන් මත අත්‍යවශ්‍ය අවස්ථාවක ලිඛිත ඉල්ලීමක් තුලින් ප්‍රධාන කොමසාරිස්තුමාගෙන්,සහය ප්‍රධාන කොමසාරිස්තුමියගෙන්(පෝතක හා බාලදක්ෂ කාන්තා කටයුතු)හෝ සහය ප්‍රධාන කොමසාරිස් (පළාත් හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ) ගෙන් ලිඛිත අවසරයක් මත මෙය වෙනස් විය හැක.

2. පෝතක රැලේ හෝ බාලදක්ෂ කණ්ඩායමේ රැස්වීම්/ශ්‍රමදාන/ක්‍රියාකාරකම් හෝ කුමන කාර්යයකදී ඉහත 01 හි සඳහන් කල නායිකාවන් සහ සහය නායිකාවන් අනිවාර්යයෙන් සිටිය යුතුය.

3. විදුහල් භූමිය තුල ඉහත කාර්යයන් වල නියැලීමට එම ළමුනට ඇඳුම් මාරු කිරීමට සුරක්ෂිත ස්ථානයක් හා වැසිකිළි පහසුකම් පිළිබඳ විශේෂ අවධානය යොමු කල යුතුය.

4. මෙම කාන්තා අංශයේ බාලදක්ෂයන් පාගමන් යවන විට එම මාර්ගයන් පිළිබඳව සුවිශේෂ අවධානය යොමු කර එම පාගමන් සැකසීමටත්, එම පාගමන් වලට කාණ්ඩායමකින් බාලදක්ෂ (කාන්තා) 4 දෙනෙකුවත් අවම වශයෙන් සහභාගීවිමත අනිවාර්යය වේ. එහිදී එම ගමන් මාර්ග තුල ගමන් මාර්ග සකසන උපදේශකයන් දන්නා හඳුනන අය වෙත හෝ ස්ථාන වෙත පෙර දැනුම් දීමක් කර තැබිය යුතුය. පාගමන් වලදී පා ගමනට සහභාගී වන 4 දෙනා ගෙන් එම පදක්කමට අවශ්‍ය කාර්යයන්. සපුරාලිය හැක්කේ දෙදෙනෙකුට පමණි. පාගමන් වලදී රාත්‍රිය කුඩාරම් තුල නවතින අවස්ථාවලදී, රාත්‍රි නවාතැන් ගන්නා ස්ථානය දිසාවේ සහය දිසා කොමසාරිස් කාන්තා කටයුතු/පුහුණු හා දිසා කොමසාරිස් වරයා දැනුවත් වී සිටිය යුතුය. එම නවතින ස්ථානයේ එම ළමුන් අයත් වන කණ්ඩායමේ කාණ්ඩ නායිකාවට හෝ සහය නායිකාවට රාත්‍රිය ළමුන් සමග ගත කල හැකි අතර එසේ නොමැති වන අවස්ථාවකදී කණ්ඩායම් නායිකාව විසින් අනුමත කරන මවකට මෙම අවස්ථාව ලබා දිය හැකිය.

5. ප්‍රගති පදක්කම් හෝ ප්‍රවිනතා පදක්කම් සමත් කිරීමේදී පදක්කම් පරීක්ෂකවරයා පිරිමි අයකු නම් වැඩිහිටි කාන්තාවක් නිරීක්ෂණ තත්වයේ එයට සහභාගී වීම අනිවාර්ය වේ.


55 ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ. Fax: +94 11 2 433 131 Telegrams: "SCOUT" Colombo

සැ.යු : බාලදක්ෂ බාලිකාවන් බාලදක්ෂ වැඩසටහන් වලට සහභාගී කර ගැනීමේ දී හා පුහුණු කටයුතු පවත්වාගෙන යාමේදී ඉහත සඳහන් ක්‍රමවේදයන් අනුගමනය කිරිම අනිවාර්ය වන අතර, යම් හෙයකින් මෙම උපදෙස් නොසලකා හැර කටයුතු කිරීමේදී ඇතිවන අනවශ්‍ය අර්බුදකාරී තත්වයන් පිළිබඳ වගකීම දිසා කොමසාරිස් තුමා ඇතුළු දිසාවේ අදාල නිළධාරීන් වෙත පැවරෙන බව අවධාරණයෙන් සඳහන් කරමු.

මේ පිළිබඳ ඔබ වෙත එවා ඇති 2011.03.15 දිනැති හා අංක 10/2011 දරණ චක්‍රලේඛයේ පිටපතක් ඔබගේ දැනගැනිම සඳහා මේ සමඟ යොමු කරමු.

එහි අංක 04 හි අවසන් පේලි දෙකෙහි සඳහන් අදහස පහත සඳහන් පරිදි පැහැදිලි කරමු.

"එම නවතින ස්ථානයේ එම ළමුන් අයත් වන කණ්ඩායමේ කණ්ඩායම් නායිකාව හෝ කණ්ඩායමේ සහාය නායිකාව රාත්‍රීයේ ළමුන් සමඟ ගත කල හැකි අතර එසේ නොහැකි වන අවස්ථාවකදී කණ්ඩායම් නායිකාව විසින් අනුමත කරන මවකට මෙම අවස්ථාව ලබා දිය හැක."

මෙම චක්‍රලේඛයේ ලබාදී ඇති උපදෙස් 2020 ජනවාරි මස සිට අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක කළ යුතු බවද කාරුණිකව දන්වා සිටිමු.

ස්තූතියි

මෙයට
බාලදක්ෂ සේවයේ නියුතු

| | | |
|---|---|---|
| *ජනප්‍රීත් ප්‍රනාන්දු* | *සරත් මාතරආරච්චි* | N.L. Fernando *චන්ද්‍රානි ප්‍රනාන්දු* |
| නියෝජ්‍ය ප්‍රධාන කොමසාරිස් | ජාතික වැඩසටහන් කොමසාරිස් | විශේෂ කොමසාරිස් |

6. පාසැල් මට්ටමේ හෝ දිසා මට්ටමේ කඳවුරු කිරීමට මෙම අංශයට අවසර ලැබෙනුයේ සම්පූර්ණයෙන්ම දිසා කොමසාරිස්වරයාගේ හා සහය දිසා කොමසාරිස් (කාන්තා කටයුතු) ගේ පූර්ණ අවසරය මත පමණි. දිසා මට්ටමේ තවත් විදුහල් හා එක්ව කඳවුරු කරන්නේ නම් සහය ප්‍රධාන කොමසාරිස් (කාන්තා කටයුතු) ගේ පූර්ණ අවසරය ලබා ගතයුතුය. ඉහත සඳහන් අවසර අවම වශයෙන් එම ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට සති 2 කට පෙර ලබා ගත යුතුය. නිසි අවසර නොලබා කටයුතු කරන නායිකාවන් කෙරෙහි කිසියම් පියවරක් ගැනීමට අපට සිදු වනු ඇත.

මෙම කඳවුරු පැවැත්වීමේදී දිසාවේ කඳවුරු වලට සහභාගී වීමේදී පහත සඳහන් කරුණු පිළිබඳව නායිකාවන් සහ සහය දිසා කොමසාරිස් (කාන්තා කටයුතු) වගකීව යුතුය.

1) බාලදක්ෂ අංශයේ (කාන්තා) සාමාජිකාවන් නවාතැන් ගන්නා ස්ථානය කඳවුරු භූමියෙන් පිට වෙනම ස්ථානයක විය යුතුය. කුඩාරම්වල කඳවුරු කරන්නේ නම් එම කඳවුරු භූමිය වෙන්ව තිබිය යුතුය. එහි වැසිකිළි හා අනෙකුත් සනීපාරක්ෂක පහසුකම් ආවරණ සහිත ස්ථාන වල විය යුතු අතර, ආරක්ෂාව පිළිබඳව විශේෂ අවධානය යොමු කල යුතුය.

2) මෙවැනි කඳවුරු වල එම කණ්ඩායම් භාර නායිකාවන් සමග විදුහලේ තවත් කාන්තා ගුරු මහත්මීන් එක් අයකු හෝ දෙදෙනෙකු සමග ළමුන්ගේ මව්වරු දෙදෙනෙකු (සංඛ්‍යව අනුව මෙම වැඩිහිටි සංඛ්‍යාව වෙනස් විය හැක.) අනිවාර්යයෙන්ම සහභාගී විය යුතුය. (ළමයින් 24 දෙදෙනෙකුට මව්වරුන් දෙදෙනෙකු බැගින් විය යුතුය.

3) මෙම අංශයේ ළමුනට උදෑසන ආගමික වතාවක් වල සිට සවස 6 දක්වා අනිකුත් ළමුන් සමග ක්‍රියාකාරකම් වලට සහභාගී විය හැක. (විශේෂ වැඩ සටහන් දිනවල කාලය වෙනස්වේ.) රාත්‍රියේ කිසිම ළමයකු පිරිමි ළමුන් කඳවුරු කරන භූමියේ කුමන හෝ කාර්යයක නිරත වීම සපුරා තහනම් වේ.

7. ඉහත කටයුතු සම්බන්ධයෙන්, කිසිම අවස්ථාවක පිරිමි නායකයින් යෙදවීමෙන් වැලකීමට වග බලා යුතුය

8. ඉහත කරුණු පිළිබඳව දිසාවේ පත්කර ඇති සහය දිසා කොමසාරිස් (කාන්තා කටයුතු) ලොග් පොතක් පවත්වාගෙන යායුතු අතර එහි දිසාවේ හෝ දිසාවට අයත් කුමන හෝ කණ්ඩායමක සිදුවන විශේෂ ක්‍රියාවන් හා ඉහත කී කරුණු වලට අදාල ක්‍රියාකරකම් සටහන් වී තිබිය යුතුය.

9. ළමුන් විදුහලෙන් පිටතට යන විට දෙමව්පිය අවසරය ලබා ගැනීම ගැන විශේෂ අවධානය යොමු කල යුතුය.

10. ඉහත සඳහන් සියළුම ක්‍රියාදාමයන් වල සම්පූර්ණ වගකීම දිසා කොමසාරිස්වරයා සතුවනු ඇත.

*(2011 මාර්තු 15 වැ දා සිට සංශෝධිත මෙම නීති පද්ධතිය ක්‍රියාත්මක වනු ඇත)*

*ඩේමියන් සිල්වා*
සහය ප්‍රධාන කොමසාරිස්
පලාත් සහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ

*ගීතා පෙරේරා*
සහය ප්‍රධාන කොමසාරිස්
පෝතක හා කාන්තා බාලදක්ෂ කටයුතු

පිටපත- ප්‍රධාන කොමසාරිස්තුමා
ගරු සභාපතිතුමා - ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
විධායක කමිටු සභාපතිතුමා/ගරු ලේකම්/ගරු භාණ්ඩාගාරික